**හක්මණ ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හක්මණ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හක්මණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ දී හක්මණ පුස්තකාලයට පරිත්‍යාග ලෙස ලැබී තිබූ වටිනාකම රු.2,678,692ක් වූ පරිගණක හා උපාංග මෙන්ම සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරන ලද රු.1,073,965 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | රු.7,950,000 ක මුදලකට ගිවිසුම්ගත වී තිබූ ප්‍රාදේශීය සභාවේ සූර්ය පැනල ව්‍යාපෘතියේ වර්ෂය අවසානයට නිමි වැඩ වටිනාකම හඳුනාගෙන ණයහිමි ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | පිළිගෙන ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාතර්ා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාල ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.1,017,029 ක වෙනසක් පැවතිණි. | නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.10,240,256 ක් වූ ගිණුම් විෂයන් 08 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ලේඛන නිවැරදි කරමින් පවතින බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.37,408,416 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම   රු.3,828,932 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,883,841 | 2,177,838 | 1,638,999 | 3,580,203 | 1,738,714 | 4,448,370 | 4,381,620 | 3,041,364 |
| (ii) | කුලී | 13,008,240 | 11,513,149 | 12,584,269 | 501,650 | 14,130,040 | 4,866,449 | 3,486,129 | 1,572,770 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,121,000 | 805,164 | 777,164 | 28,000 | 1,090,650 | 622,366 | 743,766 | - |
| (iv) | වෙනත් ආදායම් | 12,813,000 | 17,029,070 | 17,426,697 | 17280 | 15,043,100 | 9,761,650 | 9,420,711 | 414,907 |
| | | 28,826,081 | 31,525,221 | 32,427,129 | 4,127,133 | 32,002,504 | 19,698,835 | 18,032,226 | 5,029 ,041 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් ඒකක 758 කට අදාලව රු.1,314,695 ක් හා බදු දී තිබූ කඩ කාමර 178 න් 40 කට අදාළව රු.501,650 ක ආදායමක් අය විය යුතුව තිබුණි. | 2024 මාර්තු 31 දින වන විට වරිපනම් ඒකක 129 කින් රු.178,250 ක හිඟ මුදලක් අය වී ඇති බව හා 2024 අප්‍රේල් 04 වන විට කඩ කාමර 33කින් රු.292,900 අය වී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ආ) | 1992 වර්ෂයේ සිදු කළ සමීක්ෂණය මත පදනම්ව වරිපනම් ඒකක 2268 කින් වරිපනම් බදු අය කර තිබූ අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(2) වගන්තිය ප්‍රකාරව නව වරිපනම් දේපළ හඳුනා ගෙන බදු අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | නව වරිපනම් දේපළ හඳුනා ගෙන තොරතුරු රැස් කර සිතියම්ගත කිරීමෙන් පසුව 2024 පෙබරවාරි 26 දින අනුමැතිය සඳහා මාතර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කරන ලද බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වසර 05 කට වරක් වරිපනම් දේපළ තක්සේරු කළ යුතු වුවත් සභාව විසින් 2016 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදීද වරිපනම් බදු අය කර තිබුණි. | නව තක්සේරුවක් සිදු කිරීම සඳහා 2023 ජූලි 28 දින ආණ්ඩුකාරවරගේ අනුමැතිය ලැබී ඇති බවත්, තක්සේරුව සඳහා අවශ්‍ය ලියවිලි තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2023 අගෝස්තු 10 දින යොමු කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | බස්නැවතුම්පලේ අංක 08 දරන කඩ කාමරයේ බදු හිමිකරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට ඔහු කඩ කුලී ගෙවීම පැහැර හැර තිබුණ ද එම හිඟය අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. | බදුකරු සමඟ ගිවිසුම්ගත වී නොතිබීම හා බදුකරු සොයා ගත නොහැකි වීම හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඉ) | 2010 දෙසැම්බර් 27 දිනැති දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 5 වන ඡේදය ප්‍රකාරව සභාව සතු පොදු වෙළෙඳ සංකීර්ණයේ හා නව වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණු අතර එම චක්‍රලේඛයේ 11 ඡේදයට පටහැනි ලෙස සභාව සතු පොදු වෙළෙඳපොල හා බස්නැවතුම්පල වෙළෙඳ සංකීර්ණවල කඩ කාමර 02 ක් වෙනත් පාර්ශවයන් වෙත අතුරු බදුදී තිබුණි. | එක් සංකීර්ණයක කඩ කාමර 02 ක බදුකරුවන් විදේශගත වීම හා අනෙක් කඩ කාමරයේ බදුකරු මියගොස් ඇති බැවින් බිරිඳ වෙත පවරා දී ඇය සමඟ ගිවිසුම්ගතවීමට නියමිත බව මෙන්ම දෙවන සංකීර්ණයේ එක් කඩකාමරයක් නව බදුකරුවකු සමඟ ගිවිසුම්ගත වී ඇති බව හා අනෙක් කඩ කාමරය වෙනත් අයකු යොදවා ව්‍යාපාරය කර ගෙන යන බැවින් අතුරු බදු දී නොමැති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | බස් නැවතුම්පොළ වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 07ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබූ අතර ඉන් කඩ කාමර 05 කින් රු.159,500 ක හිඟ කුලී මුදලක් අයවිය යුතුව පැවතුණි. | 2024 අප්‍රේල් 04 දින වනවිට කඩ කාමර 05 කින් හිඟ මුදල් රු.33,000 ක් අය කර ගෙන ඇති බවත්, රු.120,500 ක හිඟයක් පවතින කඩ කාමරය මේ වනවිට සභාවට පවරා ගෙන ඇති බවත්, රටේ ආර්ථික තත්ත්වය අයහපත් බැවින් මෙම කඩ කාමරවල ව්‍යාපාරික කටයුතු තාවකාලිකව නතර කර ඇති බව එම බදුකරුවන් සඳහන් කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් උසාවි දඩ වෙනුවෙන් රු.470,419 ක් හා මුද්දර ගාස්තු ලෙස රු.7,377,158 ක් අය විය යුතුව තිබුණි. | දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති උසාවි දඩ ගාස්තු හා මුද්දර ගාස්තු ආදායමෙන් ඇස්තමේන්තුගත උසාවි දඩ බිල් කිරීම් රු.300,000 ක් හා මුද්දර ගාස්තු බිල් කිරීම් රු.4,900,000 ක් හැර ඉතිරි රු.170,419 ක උසාවි දඩ මුදල සම්පූර්ණයෙන්මද, ඉතිරි රු.2,477,158 ක මුද්දර ගාස්තු මුදලින් රු.2,476,133 ක්ද මේ වන විට අය කර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව පහත කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි.<br>(i) හක්මණ ඩැනී අබේවික්‍රම ක්‍රීඩාපිටිය කුලියට ලබා දීම.<br>(ii) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් නාගරික නොවන සීමාව තුළ ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම.<br>(iii) නගර ශාලාව කුලියට ලබා දීම. | හක්මණ ඩැනි අබේවික්‍රම ක්‍රීඩාපිටිය හා නගර ශාලාව කුලියට ලබා දීමට අදාළව ආණ්ඩුකාරවරගේ අනුමැතියට ද, අනෙක පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියටද ඉදිරිපත් කර ඇත. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1995 ඔක්තෝබර් 16 දින මාර්ග 136 ක් ගැසට් කිරීමෙන් පසු සභා බල ප්‍රදේශයේ ඇති මාර්ග ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර නොතිබුණි. | මේ වන විට සභාව සතු මාර්ග සියල්ල GPS Essential සහ Google Earth යන මෘදුකාංග භාවිතයෙන් මැණුම් කර ගැසට් කිරිම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදල් ලෙස ගෙවීමට ඇති රු.1,103,914 ක ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. | අදාල ශේෂය සම්බන්ධ තොරතුරු ලබා ගෙන ඉදිරියේ දී වාරික වශයෙන් ගෙවීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි විධිවිධානවලින් බැහැරව මාර්ග, කාණු පද්ධතිය, ජලය හා විදුලිය පහසුකම් සංවර්ධනය කිරීමෙන් තොරව සභා බලප්‍රදේශයේ නාගරික සීමාවට අයත් හක්මණ, දිගන, පැලවත්ත නමැති ඉඩම කැබලි 06 | යටිතල පහසුකම් සංවර්ධනය කර ඇති බැවින් 2024 පෙබරවාරි 08 දින සැලසුම් කමිටු තීරණ අංක 2024/11 යටතේ අනුමැතිය ලබා දී ඇති බව හා නිලධාරීන් විසින් සභා බලප්‍රදේශය තුළ සිදු කරන | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කට අනුබෙදුම් කර විකුණා තිබුණු අතර සභා බලප්‍රදේශය තුළ සිදුකරනු ලබන නීත්‍යානුකූල නොවන ඉඩම් අනුබෙදුම් මුල් අවස්ථාවේදීම හඳුනාගෙන ඒවා විධිමත් කිරීමට හෝ ඒවා නතර කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. . | ලද ඉඩම් අනුබෙදුම් හඳුනා ගෙන වාර්තා කළ පසු ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලබන බව. | |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරියේ ගැසට් නිවේදනයේ II වන කොටසේ 23 වගන්තියේ විධිවිධානවලින් බැහැරව අළුත්වත්ත නැමැති කැබලි කරන ලද ඉඩමෙන් පොදු කටයුතු සඳහා වෙන් කර තිබූ බිම් කැබැල්ල කැබැලි කරන ලද ඉඩමෙහි ඉහළ කොටසේ සීඝ්‍ර බෑවුම් සහිත ස්ථානයකින් ද, ජම්බුගස් කොරටුව ඉඩම වගුරු සහිත පහත් භූමියකින් ද වෙන් කර දී තිබුණි. | අදාල ඉඩම් කැබලි දෙක වැට මායිම් සකස් කර ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරන බවත්, ඉදිරියේ දී වෙන්දේසි ඉඩම් වලින් පොදු කටයුතු සඳහා යොදා ගත හැකි ස්ථාන වලින් කැබලි වෙන් කර ගැනීමට කටයුතු කරන බව. | පොදු කටයුතු බැවින් භාවිතා කිරීමට සුදුසු බිම් කැබැලි වෙන් කර ගත යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.1,782,650 මිලදී ගැනීම් 09 ක් සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178(7)(1) හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1:4:1 හා 5:2:1 යන විධිවිධාන වලින් බැහැරව කටයුතු කර තිබුණි. | මුද්‍රා තබන ලද මිල කැඳවීම් ලිපි ටෙන්ඩර් පෙට්ටියට බහා නොතිබුණ ද ඒවා බහුතරයක් ලියාපදිංචි තැපැල හා විද්‍යුත් තැපැල මගින් යොමු කර තිබූ බවත්, මේ වනවිට මිල කැඳවුම් ලියාපදිංචි තැපැල හරහා ම යොමු කරන ලෙස දැනුම් දී ඇති බවත්, ලැබෙන මිල කැඳවුම් ටෙන්ඩර් පෙට්ටියට බහා ලීමට කටයුතු කරනු ලබන බව. | මූල්‍ය හා පරිපාලන රීති හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5 (අ) ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවකට යොමු කිරීමෙන් තොරව රු.458,000 ක මුදලක් වැය කර පරිගණක යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබුණි. | 2023 වර්ෂයේ දී මිල කමිටු පවත්වනු ලබන නිශ්චිත දිනයක් හා වේලාවන් තීරණය කර නොතිබුණු බැවින් ප්‍රසම්පාදන ලිපිවල ඒ පිළිබඳව සඳහන් කිරීමට නොහැකි වූ බවත්,මේ වනවිට ස්ථිර දිනයන් හා වේලාවන් යොදා ගෙන මිල කමිටු පැවැත්වීමට කටයුතු කරනු ලබන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිමේ වැඩසටහන යටතේ රු.12,989,775 ක් වැය කර හක්මණ ආදාහනාගාරය ප්‍රතිසංස්කරණය කර තිබූ අතර, එහිදි ඉදිකිරීම්වලට අදාල සැලසුම් සකස් කර නොතිබීම, ඉටු කළ වැඩ අයිතම අනුපිළිවෙලට හඳුනා ගෙන ඇස්තමේන්තුගත නොකිරීම, ඇස්තමේන්තුගත කරන ලද රු.235,622 ක වැඩ කොටස් ඉටු නොකිරීම, ඉටු නොකළ වැඩ කොටස් සඳහා රු.72,736 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවීම, සවිකරන ලද මුළුතැන්ගෙයි ජල බේසම නියමිත ප්‍රමාණය නොතිබීම නිසා රු.5,104 ක් වැඩිපුර ගෙවීම සහ ගොඩනැගිල්ලේ ඇතුලත හා බිත්ති තීන්ත ආලේපයට අදාල මිනුම වෙන් වශයෙන් ලබා ගෙන දකුණු පළාත් ඉංජිනේරු කාර්යාලය විසින් 2020 වර්ෂයේ පළමු භාගයට Pt-21 හඳුන්වා දුන් රු.401 ක රේටය භාවිතා නොකිරීම නිසා කොන්ත්‍රාත්කරුට වර්ග මීටරයකට රු.41 බැගින් වැඩිපුර ගෙවීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. | එම කර්මාන්තයේ පැවති අඩුපාඩු හේතුවෙන් රැඳවුම් මුදල් නිදහස් නොකළ බවත්, එම අඩුපාඩු සකස් කිරීමෙන් අනතුරුව රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව. | සියළු වැඩ ඇතුළත් වන සේ නිවැරැදි රේටයන් භාවිතා කර ඇස්තමේන්තු සකස් කර නිසි ලෙස ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් කළ යුතුය. |
| (ආ) | හක්මණ ආදාහනාගාරයේ පෝරණුව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සභා අරමුදලින් රු.468,470 ක් වැය කර තිබූ අතර, පිරිවිතර සකස් කර නොතිබීම අවිධිමත් ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:8:5 (අ) ප්‍රකාරව ඇගයීම් කමිටුවට යොමු නොකිරීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. | රැඳවුම් මුදල් නිදහස් කර නොමැති බැවින් අඩුපාඩු සහ භාවිතා කළ රේටයන් මත වැඩි වූ මුදල් අඩු කර ගැනීමෙන් පසුව ඉතිරි මුදල ගෙවීමට කටයුතු කරනු ලබන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාල කාර්ය සහායක, වැඩ/ක්ෂේත්‍ර කම්කරු හා සෞඛ්‍ය කම්කරු යන තනතුරුවලට බඳවා ගෙන තිබූ සභාවේ සේවයේ නියුතු ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් 10 දෙනෙකුට ඔවුන්ගේ නිත්‍ය තනතුරුවලට අදාල නොවන රාජකාරි පවරා තිබුණි. | කාර්යාල කාර්ය සහායකයින් 02 දෙනෙකු ප්‍රමාණවත් නොවීමත්, ඔවුන් කාන්තාවන්වීමත් නිසා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් හා සෞඛ්‍ය කම්කරුවකුට කාර්යාල කාර්ය සහායක තනතුරට අදාළ රාජකාරි පවරා ඇති බවත්, මුරකරුවන් දෙදෙනාගෙන් එක් අයෙකුට | තනතුරුවලට අදාල රාජකාරි පැවරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සේවය හැර යාමේ නිවේදනය නිකුත් කර ඇති බැවින් ඒ සඳහා වැඩ ක්ෂේත්‍ර කම්කරුවකු යොදවා ඇති බවත්, රියදුරු බලපත්‍රය හිමි සෞඛ්‍ය කම්කරුවකු රියදුරු වශයෙන් යොදවා ඇති බවත්, බහුකාර්ය සංවර්ධන සහායකයින්ගෙන් 08 දෙනෙකු ක්ෂේත්‍රයේ රාජකාරි සඳහා යොදවා ඇති බැවින් මහජන සුබසාධනය, සෞඛ්‍ය කටයුතු හා මාර්ග නඩත්තු කටයුතු අඩාල වීමකින් තොරව පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලබන බව. | |
| (ආ) | සේවය අතහැරයාමේ නිවේදනය නිකුත් කර තිබූ සේවකයෙකුගෙන් අය විය යුතු රු.224,250 ක ආපදා ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විට අය කර ගෙන නොතිබුණි. | ණය අයකර ගැනීමට නීතිමය පියවර ගන්නා බවට, ඇපකරුට ද පිටපත් සහිතව ණයකරු වෙත ලිපි යොමු කිරීමෙන් පසු 2024 ජනවාරි 16 දින ණයකරු විසින් රු.5,000ක මුදලක් ගෙවා ඇති බව. | සේවක ණය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |